**ශීර්ෂය - 274 , අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 30 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යායුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකල නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී අභ්‍යන්තර පාලනය පිළිබඳ සුවිශේෂී පාලනයන් සිදුකර වාර්තා නනකරමි. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිරීක්ෂණ | | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන | මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිම කළයුතු ද යන්න මූලික විමර්ශනය සඳහා නියෝග කරන නිලධාරියා විසින් පරීක්ෂණ මණ්ඩලය වෙත නියම කළයුතු වුවද, මූලික පරීක්ෂණය අවසන් කළයුතු කාලයක් | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අවසන් වී නොමැති විමර්ශන නිශ්චිත දිනයකදී ලබාදීමට කටයුතු කරන ලෙසත්, ඉදිරියේදී |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ II වැනි කොටසේ XLVIII පරිච්ඡේදයේ 13.2 වගන්තිය | නිශ්චිතව පරීක්ෂණ මණ්ඩලය වෙත දන්වා නොතිබීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පසුගිය වසර 6 ක් තුළ සිදු කරන ලද එවැනි පරීක්ෂණ 4 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිමකර නොතිබුණි. | | මූලික විමර්ශන පැවැත්වීමේදී අවසන් කළයුතු දින ලබාදීමටත් කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 ඡේදය | යම් ප්‍රසම්පාදනයක් සඳහා ලංසු කැඳවා හෝ මිලදී ගත් පසු මිලදී ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා මිලදී ගැනීමට සිදුවන අවස්ථාවන්වලදී ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කරන ලද ප්‍රමාණයෙන් සියයට 50 ක් දක්වා පමණක් එම ලංසු මිල ගණන් යටතේ මිලදී ගත හැක. එය ඉක්මවා මිලදී ගැනීමට අවශ්‍ය වන්නේ නම් ප්‍රමාණවත් වට්ටමක් ලබාගෙන ඒ මත මිලදී ගැනීම හෝ නැවත මිල ගණන් කැඳවා මිලදී ගැනීම සිදු කළ යුතු වුවද, පළමු මිල ගණන් කැඳවීමේදී ලද මිල ගණන් යටතේම ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 50 ක් ඉක්මවා සෙවිලි තහඩු මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සත්‍ය මිලදී ගත් ප්‍රමාණයට අදාළ මූල්‍ය විචලනය (වැඩිම සියයට 46 ක් පමණි) නැවත ටෙන්ඩර් කැඳවීමට ප්‍රමාණවත් කාලයත් නොතිබුණි. |

### 1.6.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | එක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී ඇස්තමේන්තු අගය ඉක්මවා රු.2,478,156 ක් ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව විචලනයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කර අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කළයුතුය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී සියයට 10 ක විචලතාවයක් ඇති වියහැකි අතර, මෙම ඇස්තමේන්තුවේ විචලනය සියයට 8.5 ක් බැවින් සාමාන්‍ය විචලන සීමාව තුළ පවතී. |
| (ආ) | උප කොන්ත්‍රාත් පිරිනමන ලද වටිනාකම රු.6,006,157 ක් වූ වැඩ විෂයයන් 06 ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතුය. | තරඟකාරී මිල ගණන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කළද නියමිත කාල සීමාව තුළ අවසන් කිරීම සඳහා සත්භාවයෙන් කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබූ රු.122,520 ක් වටිනා විදුලි උපකරණවල ඌනතාවයක් නිරීක්ෂණය විය. | ඌනතාවය පිළිබඳ පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිකිරීම් සිදු කළ නාවික හමුදාව සමඟ සාකච්ඡා කර පරීක්ෂා කර බලා වාර්තා කරමි. |
| (ඈ) | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන මිලදී ගැනීම නිසා ඉදිකිරීම් කටයුතු අවසානයේ ඉතිරි වූ ඉදිකිරීම් ද්‍රව්‍ය අඩු මිල ගණන් මත වෙන්දේසි කිරීම නිසා රු.239,714 ක අලාභයක් සිදු වී තිබුණි. | අමුද්‍රව්‍ය තොග පාලන සහ මිලදී ගැනීම් සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අනුගමනය කළයුතුය. | කාලසීමාව සීමිත නිසා අවශ්‍ය ද්‍රව්‍ය සියයට සියයක් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට නොහැකි වීමෙන් මෙම අලාභය වැළැක්විය නොහැක. |
| (ඉ) | ඉදිකිරීම් සඳහා මිලදී ගත් රු.186,000 ක් වටිනා උපකරණ හා මෙවලම් අයිතම 51 ක් ඉදිකිරීම් කාර්යයෙහි නිරත වූ ආයතන විසින් ආපසු භාර දී නොතිබුණි | ආපසු භාරගෙන ඉන්වෙන්ට්‍රිගත කළයුතුය. | නාවික හමුදාව වෙතින් ආපසු භාරගැනීමට හෝ ඔවුන්ගේ භාණ්ඩ වට්ටෝරු පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සලසා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අමාත්‍යාංශ 21 ක්, දෙපාර්තමේන්තු 21 ක් හා කාර්යාල 2 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 5,159 ක්, රු.මිලියන 391 ක් හා රු.මිලියන 366 ක් ලෙස එකතුව රු.මිලියන 5,916 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 4,691 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 1,225 ක් හෙවත් සියයට 21 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. අමාත්‍යාංශ 06 කට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 17 සිට සියයට 78 දක්වා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබෙන ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීම. | පිළිතුරු සපයා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.

------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් එකතුව රු.53,857,691 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ව්‍යාපෘති 04 ක භෞතික කාර්යසාධනය රු.27,239,894 ක් හෙවත් සියයට 51 පමණ වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කර වර්ෂය තුළ නිම කිරීම සඳහා ප්‍රගති සමාලෝචනයන් සිදුකර ව්‍යාපෘති නිම කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | අදහස් දක්වා නැත. |

| වැඩසටහන සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ව්‍යාපෘතිය | මුළු ප්‍රතිපාදන | 2019.12.31ට වියදම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | - එම - | - එම - |
| (අ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය පලුගස්වැ | ආසිරිගම, මහවැව ප්‍රතිසංස්කරණය | 18,900,435 | 11,622,150 | - එම - | - එම - |
| (ආ) ග්‍රාමීය පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - කැකිරාව | ගනේවල්පොල පාසල් හන්දිය සිට අදාළ වටරවුම් පාර ගල් අතුරා ප්‍රතිසංස්කරණය | 21,080,713 | 12,115,344 | - එම - | - එම - |
| (ඇ) ග්‍රාමීය පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - මිහින්තලේ | ඒ9 මාර්ගයේ ජයන්ති හන්දිය සිට ගැමුණු විදුහල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය | 12,876,543 | 3,502,400 | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය 2019 - තිරප්පනේ | පඩිකෙටුවැව ඉස්මත්තේ සිට පුරාණ වෙළ හරහා කෘෂි මාර්ගය ඉදිකිරීම | 1,000,000 | -- |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ මිහින්තලේ ඒ9 මාර්ගයේ ජයන්ති හන්දිය සිට ගැමුණු මහා විද්‍යාලය දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.8,510,800 ක් වෙන් කර තිබුණි. එහෙත් 2020 පෙබරවාරි 20 දින වන විටත් එම මාර්ගයේ මාර්ගය දෙපස පැති කාණු සැකසීම, හියුම් පයිප්ප බෝක්කුවක් යෙදීම හා ඇස්පෝල්ට් අතුරා කාපට් යෙදීම යන විෂයයන් සඳහා පිළිවෙලින් රු.320,500 ක්, රු.378,900 ක් සහ රු.4,060,000 ක් ලෙස එකතුව රු.4,759,400 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම වැඩ කොටස් ඉටු කර නොතිබුණි. | අදාළ අමාත්‍යාංශය වෙතින් අවිච්ඡේද අනුමත කරවා ගෙන කඩිනමින් ව්‍යාපෘතිය නිම කළ යුතුය. | දෙසැම්බර් මස පැවති වර්ෂාව හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වූ අතර, 2020 අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

## 3.3 මුදල් නිදහස් කර තිබූ නමුත්, ප්‍රගතිය ලබා නොගත් ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ උතුරු හා උතුරු මැද පළාත් වල වෙසෙන ණයගැතිභාවයෙන් පෙලෙන ජනතාවට ණය පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම සඳහා 2018 වර්ෂය තුළ රු.මිලියන 250 ක් වෙන් කර දී තිබුණි. 2019 වර්ෂයේ ජනවාරි මාසයේදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එම ප්‍රතිපාදන මුදාහැර තිබුණු අතර එම දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සමඟ ගිවිසුමකට එකඟ වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට එම වැඩසටහන යටතේ ණය පහසුකම් ණය නිකුත් කර තිබුණේ රු.මිලියන 6.5 ක් පමණක් බැවින්, ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 243.5 ක් හෙවත් සියයට 97.39 ක් ඊට අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘති යෝජනාවල සඳහන් මිණුම් දඬු සංශෝධනය කර අපේක්ෂිත අරමුණු සඳහා ණය නිකුත් කිරීමේ වැඩපිළිවෙල කඩිනම් කළයුතුය. | ව්‍යාපෘතියේ ණය ලබාදීමේ නිර්ණායක සංශෝධනය සඳහා අදාළ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ වැට ඉදිකිරීම සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 ඡේදය ප්‍රකාරව වැඩ කොන්ත්‍රාත් වලදී ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සැසඳීම් කර විස්තරාත්මක ලංසු ඇගයීම සඳහා ලබාදී තිබූ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව සුදුසුකම් ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් 5 දෙනෙකු ප්‍රතික්ෂේප කර 6 වන ස්ථානයට මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් රු.287,821 ක අලාභයක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වන අතර අලාභයට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නැත. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බයිසිකල් නැවතුම් ස්ථානය අලුත්වැඩියා කිරීම මැයෙන් රු.4,884,950 ක ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකමකට අදාළව සිදු කළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රු.4,640,203 ක මිලකට ලංසුකරුවෙක් තෝරාගෙන තිබුණි. ආයතන 28 ක් වෙත ලංසු ආරාධනා ලිපි ලියාපදිංචි තැපෑලෙන් යවා තිබූ නමුත්, එම ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසුකරුවන්ට කොන්ත්‍රාත්තුව පිළිබඳ තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් හා එම ආරාධනා ලිපි නොලැබීම හේතුවෙන් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ලංසු ආරාධනා ලිපි යවන ලද ලංසුකරුවන් 8 දෙනෙකුට සී 7 හෝ 8 සහිත ඉක්ටැඩ් ලියාපදිංචිය නොතිබුණු අතර, ලංසුකරුවන් තිදෙනෙකු වෙත ලිපි යවන ලද ලිපිනයන් වෙනස් වී තිබුණි. එමෙන්ම තවත් ලංසුකරුවන් 03 දෙනෙකු ලියාපදිංචි ලිපි ලැබී නොතිබුණු බවට විගණනයට තහවුරු කර තිබුණි. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය විධිමත් පරිදි තරඟකාරී මිල ගණන් ලබාගැනීමකින් තොරව ඇස්තමේන්තු මිලෙන් සියයට 95 කට පිරිනමන ලද කොන්ත්‍රාත්තුවක් බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. | ආයතන 28 ක් වෙත ආරාධනා ලිපි ලියාපදිංචි තැපෑලෙන් යැවීම, එම ලිපි ආපසු නොලැබීම හා ප්‍රමාණවත් කාලයක් ලබාදීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණවත් තරඟකාරීත්වයක් තිබූ බවට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සෑහීමට පත් වී ඇත. |
| (ඇ) ගම්පෙරළිය වේගවත් සංවර්ධන වැඩසටහන සඳහා සින්ක් ඇලුමිනියම් සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා පැවති ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සුදුසුකම් ලත් අවම ලංසුකරුගේ සෙවිලි තහඩු මිලදී ගැනීම සිදු නොකර වැඩි මිල ගණන් යටතේ සෙවිලි තහඩු මිලදී ගැනීමට නිර්දේශ කිරීම හේතුවෙන් රු.1,120,303 ක අලාභයක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුය. | මහගල්කඩවල හාඩ්වෙයාර් ආයතනයේ පරිපාලිත සමාගමක් වූ BMC Roofing ආයතනයේ පළපුරුද්ද වසර 10 ක් නොමැති බැවින් අවම මිල ඉදිරිපත් කළ ලංසුව ප්‍රතික්ෂේප කර ඇත. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයේ සටහන II ආකෘතියට අනුව 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළදී වාහන 16 කට සිදු වූ රු.2,459,248 ක් වූ අලාභයන්ගෙන් රු.2,334,643 ක් අයකර ඇතත්, මේ වන තෙක් ඊට අදාළ පරීක්ෂණ අවසන් කර පාඩු හා හානි පොත්වලින් කපාහැරීමට අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය | අදහස් දක්වා නැත. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ගම්පෙරළිය වේගවත් සංවර්ධන වැඩසටහන යටතේ මෛත්‍රීපාල සේනානායක මාවත සිට කුම්බිච්චන්කුලම වැව දක්වා මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් විෂයයන් නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටු කර තිබියදීත් වැඩිපුර රු.41,584 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ඇතිනම් ඒ සඳහා අවශ්‍ය පියවර ගතයුතුය. | ගෙවීම් කරනු ලබන අවස්ථාවේදී නැවත පරීක්ෂා කර බලා නිවැරදි මිණුම් අනුව ගෙවීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 2 ක බලපත්‍ර ඉඩම් වලින් රජයේ ගාස්තු නොගෙවා අනවසරයෙන් බොරළු ඉවත් කර ගැනීම වෙනුවෙන් කියුබ් 694 ක් සඳහා අයකළ යුතු රජයේ ගාස්තු රු.129,968 ක් අයකරගෙන නොතිබුණි. | අනවසරයෙන් බොරළු ඉවත් කර ගැනීම් වෙනුවෙන් පරීක්ෂා කර බලා එම ගාස්තු අයකළ යුතුය. | අදහස් දක්වා නැත. |
| (ඇ) බොරළු කැණීම් කිරීමේදී භූමිය පුනස්ථාපන තැන්පතු වෙනුවෙන් බොරළු කියුබ් 1 ක් සඳහා රු.200 බැගින් තැන්පත් මුදල් ලබාගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ක අවස්ථා 25 කදී රඳවා ගතයුතු තැන්පත් මුදල් රු.5,575,600 ක් රඳවා නොගැනීම හේතුවෙන් අදාළ ස්ථානවල පරිසරය යථාවත් කිරීම නිවැරදිව සිදු වී නොතිබුණි. | අදාළ කැනීම්කරු එම කාර්යය ඉටු නොකරයි නම් එම තැන්පත් මුදලින් එය ඉටු කළයුතු වන අතර එසේ නොකරන පාර්ශ්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නොමැත |

| | | |
|---|---|---|
| (ඈ) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක ක්‍රියාත්මක කර තිබූ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ ණය යෝජනා ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ ණය ශේෂය රු.15,816,936 ක් විය. එම ණය වලින් මාස 06 ත් අවුරුදු 01 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබූ ණය රු.415,588 ක්ද, අවුරුදු 01 ට වඩා වැඩි කාලයක් ප්‍රමාද වූ ණය ශේෂය රු.5,749,170 ක් ද විය. | චක්‍රීය ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ණය අයකර ගැනීම යාවත්කාලීන කළයුතුය. | අය කරගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) ආගමික ස්ථානවලට සූර්යබල පද්ධති සපයා සවි කිරීම සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු ලියකියවිලිවල සඳහන් වූ මෙන්ම සුදුසුකම් ලත් ලංසුකරු එකඟ වූ සූර්යබල පද්ධතියේ Photovoltaic Inverter කොටස සඳහා වසර 10 කද, Solar PV Module ය සඳහා වසර 25 කද, Wring and Cabling සඳහා වසර 20 කද වගකීම් කාලයක් ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ සවිකර තිබූ වටිනාකම රු.6,225,000 ක් වූ සූර්යබල පද්ධති 15 ක් සඳහා ඉහත කී වගකීම් කාලයන් ලබාදී තිබූ බවට සාක්ෂි නොතිබුණි. | අදාළ වගකීම් සහතික ප්‍රතිලාභීන්ට ලබාදිය යුතුය. | ඉදිරියේදී ලබාදීමට නියමිතයි. |
| (ඊ) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ 2017 සහ 2018 වර්ෂයන්හි නීත්‍යානුකූල බලපත්‍ර ලබාගැනීමකින් තොරව හා ලබාගත් බලපත්‍ර අවභාවිතා කර සිදු කරන ලද බොරළු කැණීම් වලින් රජයට අහිමි වූ ආදායම රු.මිලියන 42.9 ක් පමණ විය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය සමඟ එක්ව සුදුසු අභ්‍යන්තර පාලන වැඩපිළිවෙලක් සැකසිය යුතුය. | පිළිතුරු දී නැත. |
| (උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වැඩ තහනම් කර තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.1,810,546 ක් වූ අතර, එම ණය ශේෂයෙන් රු.928,421 ක් වසර 05 කට වඩා පැරණි ණය ශේෂයන් විය. | ණය ලාභියා සමඟ ඇති ගිවිසුම ප්‍රකාරව අදාළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**4.** **යහපාලනය**

---------------

**4.1** **මහජනයා වෙත සේවා ඉටු කිරීම**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | -------------------------------- |
| රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා තක්සේරු වටිනාකම අයකරගෙන දීර්ඝ කාලීන බලපත්‍ර ලබාදිය යුතු ඉඩම් කොටස් 2 ක් , නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 279 දරන | තක්සේරු වටිනාකම අයකරගෙන දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදිය යුතුයි. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් සඳහා යොමු කර ඇත. |

මහකලත්තෑව ග්‍රාම නිලධාරී වසමේ පුද්ගලයින් දෙදෙනෙකු වෙත ලබාදී තිබුණි. මෙම බලපත්‍ර ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ආදායම රු.144,000 ට අඩු අය සඳහා ලබාදෙන නිදහස් බලපත්‍ර 2 ක් බව තවදුරටත් නිරීක්ෂණය විය.